පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නර්තනය..............................................

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය : පැය:2.30

## I වන කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01 උඩරට ගොඩ සරඹ වල 8 වන සරඹයේ නාමය වන්නේ.

i අංගහාර හරඹය ii දෑල හරඹය

iii අර්ධ චක්‍ර හරඹය iv ඇල හරඹය

02 මාත්‍රා 3 තාලයට අයත් බෙර පදය වන්නේ

i දොදොංත තකු දොං ii කුදගත ගත දොං

iii දොං ජිංත ගත දොංත iv ජිං ගත ගොගො

03 ඝන වාද්‍ය භාණ්ඩයක් වයමින් නටන ගැමි නැටුමක් වන්නේ

i තාලම් නැටුම ii ලී කෙළි නැටුම

iii කුලු නැටුම iv කඩු නැටුම

04 නර්තන නිර්මාණයට වඩාත් සුදුසු වෘත්තීය මිනිස් චරිතයක් වන්නේ.

i පොලිස් නිලධාරියා ii ධීවරයා

iii ගුරුවරයා iv වෙළෙන්දා

05 '' භය '' නැමැති ස්ථායි භාවය මගින් නිරූපණය වන රසය වන්නේ.

i කරුණා රසයයි. ii භයානක රසයයි.

iii වීර රසයයි. iv ශෘංගාර රසයයි.

ප්‍රශ්න අංක 06 සිට 08 දක්වා ප්‍රශ්න වලට වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| තිරුව | 1 | 2 | 3 |
| --- | --- | --- | --- |
| A | බෙර පුහුල | ලතාවල්පොළ | කඩිප්පුව |
| B | ඉල්ලම් මුදු | කඩතිර | දේවදාසින් |
| C | R. මුත්තසාමි | සුසිර | බෙනඩික් ප්‍රනාන්දු |

06 ගැටබෙරයේ කොටස් දැක්වෙන තීරුව වන්නේ.

i A තීරුවේ 3 පේලියේ
ii A තීරුවේ 1 පේලියේ
iii B තීරුවේ 1 පේලියේ
iv B තීරුවේ 2 පේලියේ

07 '' රන්වන්දුන් කරලින් පැසිලා '' ගීතයේ පද රචනය කරන රචකයා දැක්වෙන තීරුව වන්නේ,

i C තීරුවේ 1 පේලියේ
ii A තීරුවේ 2 පේලියේ
iii C තීරුවේ 3 පේලියේ
iv B තීරුවේ 3 පේලියේ

08 ශාන්ති කර්ම වලදී රංග සැරසිල්ල ආවරණයට යොදා ගන්නා සුදු පිරුවටය හඳුන්වන නාමය දැක්වෙන්නේ,

i A තීරුවේ 3 පේලියේ
ii B තීරුවේ 3 පේලියේ
iii C තීරුවේ 2 පේලියේ
iv B තීරුවේ 2 පේලියේ

09 උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් අවේණික පද වන්නේ

i මාලක්කම් / කස්තිරම්
ii කස්තිරම් / ඉරට්ටිය
iii මණ්ඩිය / සුරල
iv සීරුමාරුව / කස්තිරම්

10 කොහොඹාකාංකාරි ශාන්ති කර්මයේ පූර්ව චාරිත්‍රයකි.

i කප් සිටුවීම
ii ගිණි පැගීම
iii මඩු පේ කිරීම
iv තොටමෙට යෑම

11 '' යක් ඇනුම'' නර්තන අංගය අයත් ශාන්ති කර්මය වන්නේ.

i දෙවොල්මඩු ශාන්ති කර්මය
ii රට යකුම ශාන්ති කර්මය
iii කොහොඹාකංකාරි ශාන්ති කර්මය
iv පහන්මඩු ශාන්ති කර්මය

12 ''සංගීත් භාත්ඛණ්ඩ'' ආයතනයේ හා ''කථක් කේන්ද්‍රයේ'' ගුරුවරයෙකු ලෙස සේවය කළ ශිල්පියකි.

i අයිවන් මහරාජ්
ii නවාඩ් වලිජ් අලීෂා
iii බිර්ජු මහරාජ්
iv ශිවනාදන්

13 ශාන්ති කමර් ආශ්‍රිත කවි භාවිතයට ගනු ලබන්නේ

i පන් නෙලීමේ නැටුමේ දී
ii පතුරු නැටුමේ දී
iii චාමර නැටුමේ දී
iv ගොයම් නැටුමේ දී

14 '' ශාන්ති දේවගෝෂ් '' නිෂ්පාදනය කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය වනුයේ,

i සැලළිහිණි මුද්‍රානාට්‍ය
ii උදාව මුද්‍රානාට්‍ය
iii සීතාහරණ මුද්‍රානාට්‍ය
iv චණ්ඩාලිකා මුද්‍රානාට්‍ය

15 '' ගත්ත තෙහිඟු තකට තකුද''

i කස්තිරමකි.
ii බෙරපදයකි.
iii සීරුමාරුවකි.
iv අඩව්වකි.

16 ද්‍රවිඩ ගැමි නැටුම් අතර මුරුගන් දෙවියන් වෙනුවෙන් නර්තනය කරනු ලබන්නේ,

i කෝලාට්ටම්ය. ii කාවඩිය.

iii සුලකුය. iv වෙම්බුය.

17 මහනුවර දළදා පෙරහැරේ හැකිය හැකි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් විශේෂාංගය වන්නේ,

i උඩැක්කි , චේවැල් , වෙස් ii උඩැක්කි , වෙස් , පන්තේරු

iii තෙල්මේ , උඩැක්කි , වෙස් iv තාලම් , වෙස් , පන්තේරු

18 ගැටබෙර වාදනයට අදාළ පද කොටසක් වන්නේ,

i ජෙඟට ජෙඟට ජෙඟ ii ජෙජෙං ජෙංත තකට

iii රිමි ගත ගත් දැහිමි iv දොං ජිං ජිං තකඩ දොංතක

19 උඩරට වන්නමට අයත් කොටස් ගණන,

i තුනකි. ii හතරකි.

iii පහකි. iv හයකි.

20 කාන්තා ලාලිත්‍ය පෙන්වන ගැමි නැටුමක් වන්නේ

i සවරං ii කලගෙඩි

iii පතුරු iv ලී කෙලි

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(1) I දෙකිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 3)
II නර්තන කලාව හා බැඳි ඓතිහාසික මූලාශ්‍ර 3ක් නම් කරන්න. (ලකුණු 3)
III ශ්‍රී ලංකාවේ නිශ්පාදිත මුද්‍රා නාට්‍ය 03 ක් ලියන්න. (ලකුණු 3)
IV කථක් නර්ථන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 03 ක් ලියන්න. (ලකුණු 3)

(2) I මාත්‍රා 4+4 තනි තිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 2)
II මාත්‍රා 3+3 තනි තිතට අයත් කවියක් ලියන්න. (ලකුණු 4)
III වෛරොඩි වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 6)

(3) I ශාන්ති කර්මයක් පැවැත් වීමට හේතු වූ කරුණු 03 ක් ලියන්න. (ලකුණු 3)
II දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)
III දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුරාවෘත්තය කෙටියෙන් ලියන්න. (ලකුණු 6)

(4) I ඔබ දන්නා ගැමි නැටුම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
II ගැමි නැටුම් වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 4)
III ගොයම් කවියක් හා පන් නෙලීමේ කවියක් ලියන්න. (ලකුණු 6)

(5) I සතර බීජාක්ෂර නම් කරන්න. (ලකුණු 2)
II පහත සදහන් වාදන භාණ්ඩ පංච තූර්ය වාදන භාණ්ඩ වර්ගීකරණය අනුව වර්ග කරන්න. (ලකුණු 4)

1. හක්ගෙඩිය 3. තලිය (ලකුණු 6)
2. රබාන 4. තම්මැට්ටම

III ගැට බෙරය නිර්මාණය සඳහා ගන්නා අමු ද්‍රව්‍ය 04 ක් නම් කර එම වාද්‍ය භාණ්ඩය වාදනය කරන අවස්ථා දෙකක් ලියන්න (ලකුණු 6)

(6) I කථක් නර්තන ඝරානා (ගුරුකුල) 04 ක් නම් කරන්න (ලකුණු 4)
II එම නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය නම් කර වාද්‍ය භාණ්ඩ 03 ක් ලියන්න. (ලකුණු 4)
III කථක් නර්තන අංග 02 ක් නම් කර රංග වස්ත්‍රාභරණ පිළිබඳ පැහැදිලි කරන්න (ලකුණු 4)

(7) පහත සදහන් මාතෘකා වලින් 03 ක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

I චලන
II විල්සන් ඔලබොටුව
III සංදේශ කාව්‍ය
IV වන්නම්
V දණ්ඩියමේ සරඹ

(ලකුණු 3X4)

## නර්තනය තෙවන වාර පරීක්ෂණය
## 9 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය
## I කොටස

| | | | |
|---|---|---|---|
| (1). III | (6). II | (11). III | (16). II |
| (2). IV | (7). III | (12). III | (17). II |
| (3). I | (8). IV | (13). I | (18). IV |
| (4). II | (9). IV | (14). III | (19). IV |
| (5). II | (10). I | (15). IV | (20). II |

## I කොටස

(1) I. සුළු මැදුම් දෙතිත
සුළු මහ දෙතිත
මැදුම් මහ දෙතිත

II. වංශකථා (සාහිත්‍ය කෘති)
රූකම් / කැටයම්
සංදේශ කාව්‍ය
සෙල්ලිපි / ලෙන් ලිපි

III. කරදිය, නල දමයන්ති, චණ්ඩාලිකා, ශිම රංග
හිම කුමාරි, රන් කිකිලි, උදාව, රන්දද
සැළලිහිණිය, පරෙවිය, ගමන, සත්පත්තිනි, ග්‍රහ අපලය

IV. මහා රාෂ්ට්‍රය
ගුජ රාට්
රාජස්ථාන
දිල්ලි
ලක්නව්

(2) I.

| 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
|---|---|---|---|
| දො දොං - ත | ත කු දොං - | දො දොං - ත | ත කු දොං - |

II. ඕනෑම මාත්‍රා 3 ට අයත් කවියක් ලිවිය හැකිය.

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| තක් | කඩ | ජිත් | කඩ | තරි | කිට | ත | ක | ට | ත | කු | ඳ |
| ග | ත | කු | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| තා | - | තත් | කඩ | තරි | කිට | ජිත් | - | ජිත් | කඩ | තරි | කිට |
| තොං | - | තොං | කඩ | තරි | කිට | නං | | | | | |

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**